**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - 2019**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2 019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය ,මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයනු ලැබේ.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- සමස්ත ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයනු ලැබේ.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී.ලං.ගි.ප්‍ර.16 - දේපල, පිරියත හා උපකරණ :-**<br>(i) 2019 දෙසැම්බර් 31 දින වන විට ලියාහල අගය රු .4,506,692 721 ක් වූ ලිඛිත වටිනාකමක් සහිත වත්කම් කාණ්ඩ 07 ක සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර නොතිබුණි. | දේපල, පිරියත හා උපකරණ වල ඇතුළත් සුන්බුන් වටිනාකම දැනට ලබා ගනුයේ එම දේපල බැහැර කරන විට හෝ වෙන්දේසි කරන විටය. මෙයට හේතු වී ඇත්තේ සංකීර්ණ ව්‍යුහය සහ වත්කම්වල ප්‍රධාන උප කාණ්ඩවලට සම්බන්ධ කොටස් සහ සංරචක වල ඒකාබද්ධ බව සහ ආයෝජන මණ්ඩලයේ වත්කම් පරිමාවයි. 2020 දී මණ්ඩලය විසින් දැනට පවත්නා මෝටර් රථ හා පරිගණක පිළිබඳ ප්‍රතිපත්තිය සමාලෝචනය කරනු ඇති නමුත් ක්ෂයවීම් පිළිබඳ සමාලෝචනයේ ප්‍රතිඵලයෙහි බලපෑම නොසලකා හැරිය හැකි අතර ප්‍රමාණාත්මක නොවිය හැකිය. | වත්කමක සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේ සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂිත අගයන් පෙර ඇස්තමේන්තු වලට වඩා වෙනස් නම්; ශ්‍රී.ලං.ගි.ප්‍ර. 08 ට අනුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සම්පූර්ණයෙන් ක්ෂය වූ මෝටර් රථ 125 ක සහ ස්ථාවර වත්කම් ලේඛනයයේ ඇතුළත් සම්පූර්ණයෙන් ක්ෂය වූ පරිගණක සහ පරිගණක උපාංග 3378 ක දළ ගෙනයාමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | 2020 වර්ෂයේදී අනාවරණය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දේපල, පිරියත හා උපකරණ වල දළ ගෙනයාමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |
| (ආ) | **ශ්‍රී.ලං.ගි.ප්‍ර.40 - ආයෝජන වත්කම්:-** ආයෝජන අරමුණු සඳහා භාවිතා කරන ලද සහ බදු දීම සඳහා 2019 වර්ෂයේ දී ගිවිසුම් වලට එළඹි රු. 15,833,204 ක් පිරිවැය වූ ,බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ පිහිටි ඉඩම් කැබලි තුනක් 2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපල ලෙස හඳුනාගෙන නො තිබුණි**.** | 2020 වර්ෂය තුලදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. | ආයෝජන අරමුණු සඳහා භාවිතා කරන ඉඩම් මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපල ලෙස හඳුනාගත යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීතාවක අපනයන සැකසුම් කලාපයේ පොදු අපජල පවිත්‍රාගාරයේ රොන්මඩ බැහැර කිරීම සඳහා කණින ලද වලවල් දෙකක් වෙනුවෙන් දරන ලද, ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකිය නොහැකි රු 13,612,996 ක් කෙරීගෙන යන වැඩ වල ඇතුළත් කර තිබුණි. එබැවින්, 2019 දෙසැම්බර් 31 දින වන විට කෙරීගෙන යන වැඩ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එය පෙර වර්ෂයේ ගැලපුමක් ලෙස 2020 දී ගැලපීමට සටහන් කර ගන්නා ලදී. | ප්‍රාග්ධන වියදම් ලෙස සැලකිය නොහැකි වියදම් කෙරීගෙන යන වැඩ වල ඇතුළත් නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2019 ජුනි 03 දිනැති අංක 2126/12 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අපනයන සැකසුම් කලාපයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලය වෙනුවෙන් ප්‍රදානය කරන ලද රු 96,166,796 ක් වූ බිංගිරියෙහි පිහිටි ඉඩමක් මණ්ඩලයේ දේපලක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. එබැවින්, 2019 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ වල ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 ජුනි 03 දිනැති අංක 2126/12 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මණ්ඩලය වෙනුවෙන් ප්‍රදානය කරන ලද බිංගිරියෙහි පිහිටි ඉඩම ජනාධිපතිවරයා විසින් පවරාදීමේ නියෝගය අත්සන් කරන තෙක් ප්‍රාග්ධණිත කල නොහැක. පවරාදීමේ නියෝගය කඩිනමින් ලබා ගැනීමටත් 2020 මුදල් වර්ෂයේදී ගිණුම්ගත කිරීමටත් පියවර ගනු ලැබේ. | ගැසට් පත්‍රය ඉඩම පැවරීම සඳහා වන නීතිමය ලේඛනය බැවින් අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මණ්ඩලයට ලබා දී ඇති ඉඩම් මූල්‍ය ප්‍රකාශයන්හි මණ්ඩලයේ දේපලක් ලෙස පෙන්විය යුතුය. |
| (ඇ) මාර්ගයක් පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම පරිදි මණ්ඩලය වෙත ප්‍රතිපූරණය කිරීමේ පදනම මත උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත මණ්ඩලය විසින් ගෙවන ලද ආරම්භක පරිපාලන වියදම් රු. 51,500,000 ක් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදලක් ලෙස 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එය පෙර වර්ෂයේ ගැලපුමක් ලෙස 2020 දී ගැලපීමට සටහන් කර ගන්නා ලදී. | ප්‍රතිපූරණය කිරීමේ පදනම මත බාහිර පාර්ශවයන් වෙනුවෙන් මණ්ඩලය විසින් දරනු ලබන වියදම් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස පෙන්විය යුතුය.<br>. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම
-----------------------------------------

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| විලම්බිත වියදම් ක්‍රමක්ෂය<br>- මණ්ඩලයේ කාර්යාලය නැවත ස්ථානගත කිරීම | 6,169,237 | 2016 ජනවාරි 01 දිනට පෙර ශේෂය සඳහා ශේෂ සනාථ | 2016 ජනවාරි 01 දිනට පෙර විලම්බිත වියදම් විස්තර ආයෝජන මණ්ඩලය සතුව නොමැත. කෙසේ වෙතත් මෙම කරුණු පිළිබඳව පෙර පැවති විගණන කමිටු රැස්වීමකදී සාකච්ඡා කරනලද අතර | 2016 ජනවාරි 01 දිනට පෙර ශේෂය සඳහා ශේෂ සනාථ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| - විලම්බිත කලාප සංවර්ධන වියදම් | 37,500,264 | 2016 ජනවාරි 01 දිනට පෙර ශේෂය සඳහා ශේෂ සනාථ | විලම්භිත වියදම් සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කිරීමට එහිදී එකඟ විය. ආයෝජන මණ්ඩලය විසින් එම පියවර දැනටමත් ගෙන ඇත. |

**1.6** **අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 13 (2) (ආ) වගන්තිය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබාගැනීමෙන් පසු එකතුව රු. 608, 822, 284ක් වූ දීමනා 08ක් මණ්ඩලය විසින් එහි කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි. | අවදානම් දීමනාව සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සහ වෙනත් දීමනා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.<br>2019 මැයි මාසයේදී ගරු ඇමතිවරයාගේ අනුමැතිය ඉල්ලා ඇත. | රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍ය වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටිනලද අනුමැතිය නොලැබුනු නමුත් පොලී රහිත ණය වර්ග තුනකින් සහ 4.2 ක පොළී ප්‍රතිශතයකින් යුතු ණය වර්ග හයකින් යුතු සේවක ණය යෝජනා ක්‍රමය 2007 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2019 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු.856,887, 308 ක් විය. | ආයෝජන මණ්ඩලයේ සියලුම ණය යෝජනා ක්‍රම ආරම්භයේ සිටම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කරන ලද අතර එම ප්‍රතිලාභ සේවකයින් විසින් අද දක්වා භුක්ති විඳිමින් සිටී.<br>පසුව, එම ණය යෝජනා ක්‍රම 2007 මාර්තු 20 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන මණ්ඩලයේ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොතට ඇතුළත් කරන ලදී. ආයෝජන මණ්ඩලයේ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත සඳහා අනුමැතිය 2014 මාර්තු 10 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. | සේවක ණය යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | ඕනෑම නිවාස කටයුත්තක් සම්බන්ධයෙන් රාජ්‍ය හෝ පෞද්ගලික බැංකුවකින් හෝ ණය සපයන ආයතනයකින් ණය ලබාගත් සේවකයෙකුට සත්‍ය වාර්ෂික ණය පොළී අනුපාතය සහ සියයට 20.5 ක් දක්වා උපරිම සීමාවකට යටත්ව සියයට 4.2 ක වාර්ෂික ණය පොළී අනුපාතය අතර වෙනස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ප්‍රතිපූර්ණය කරනු ලැබේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ඉහත ණය යෝජනා ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. 42,410,893 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබුණි. | මණ්ඩලයේ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත සඳහා 2014 මාර්තු 10 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. | සේවක ණය යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

**1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.7.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2019 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදල රු. 725,609,535 ක් වූ අතර ඉන් රු. 328,869,617ක මුදලක් හෙවත් සියයට 45 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. | 2012 වර්ෂය දක්වාවූ ලැබියයුතු මුදල් ලිහාහැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීම සඳහා අදාල තොරතුරු රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර ඇත. එසේම 2013 වර්ෂයේ සිට අය නොවී පවතින ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම සඳහා විධායක අධ්‍යක්ෂ (අයකරගැනීම්) පත්කර ඇත. ලැබියයුතු මුදල් සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම සඳහාත් ගිවිසුමේ නියමයන් හා කොන්දේසි අනුව කටයුතු ආරම්භ කිරීම සඳහාත් සෑම වර්ෂයකම මාර්තු 31 දින වන විට | හිඟහිට් ශේෂයන් ප්‍රමාදයකින් තොරව අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාර්ෂික ගාස්තුව රු. 320,884,027 ක් වූ අතර ඉන් රු. 188,720,430 ක් හෙවත් සියයට 59 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. | නිරාකරණය කර නොමැති වාර්ෂික ගාස්තු ඉන්වොයිසි, අයකර ගැනීමේ ඒකකයට භාර දෙන ලෙස මූල්‍ය දෙපාර්තමේන්තුවට උපදෙස් දී තිබේ. | හිඟහිටි ශේෂයන් ප්‍රමාදයකින් තොරව අයකරගත යුතුය. |
| (ඇ) | ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදලින් හානිකරණය සඳහා ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපාර වලින් ලැබිය යුතු මුළු මුදලින් සියයට 57 ක් නියෝජනය කර තිබුණි. හානිකරණය සඳහා වූ රු. 410,118,417 ක මුළු ප්‍රතිපාදනයෙන් රු. 350,111,099 ක් හෙවත් සියයට 84 ක් 2019 දෙසැම්බර් 31 දිනට අවලංගු කරන ලද , වසා දැමුණු සහ මෙහෙයුම් අත්හිට වූ ව්‍යාපෘති වලින් ලැබිය යුතු මුදල් සඳහා කරන ලද හානිකරණ ප්‍රතිපාදනයෙන් නියෝජනය විය. | | හිඟහිටි ශේෂයන් අයකරගැනීම සඳහා නීතිමය පියවර ගැනීම හෝ අයකරගත නොහැකි වටිනාකම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකිරීම කල යුතුය. |
| (ඈ) | ලැබිය යුතු වාර්ෂික ගාස්තුව සඳහා වූ මුළු හානිකරණය සඳහා ප්‍රතිපාදනයෙන් රු249,688,279 ක් හෙවත් සියයට 93 ක් අවලංගු කරන ලද ව්‍යාපෘති 788 කින් වසා දැමූ ව්‍යාපෘති 42 කින් සහ මෙහෙයුම් අත්හිටුවන ලද ව්‍යාපෘති 51 කින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය. | | හිඟහිටි ශේෂයන් අයකරගැනීම සඳහා නීතිමය පියවර ගැනීම හෝ අයකරගත නොහැකි ලෙස හඳුනා ගත් වටිනාකම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම කල යුතුය. |
| (ඉ) | ජල ආදායම් සඳහා වූ හානිකරණය සඳහා මුළු ප්‍රතිපාදනයෙන් රු. 1,404,086 ක් රජයේ ආයතනවලින් සහ චතුපිටිවල හා හොරණ නිවාස යෝජනා ක්‍රමවල ප්‍රතිලාභීන්ගෙන් ලැබිය යුතු හිඟ මුදල් නියෝජනය කර ඇත. වසර 3 ක් මුළුල්ලේ අය නොවී පවතින මෙම හිඟ මුදල් 2019 දෙසැම්බර් 31 වන විටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | නිවැසියන් කිහිප දෙනෙකු තම ස්ථාන අතහැර ගොස් ඇති අතර සමහරු බාහිර පාර්ශවයන් සඳහා නිවාස කුලියට දී ඇත. එබැවින් ලිපි භාර දීම සඳහා ඔවුන්ගේ නිවැරදි තැපැල් ලිපිනය සොයා ගැනීම දුෂ්කර වී ඇත. හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇති අතර හිඟ ශේෂය අය කර ගැනීමට අපොහොසත් වුවහොත් නීතිමය පියවර ගනු ලැබේ. | හිඟහිටි ශේෂයන් ප්‍රමාදයකින් තොරව අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වතුපිටිවල නිවාස ඒකක වෙන්දේසිකරුවකු වූ පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.1,604,200 ක මුදලක් වර්ෂ නවයකට අධික කාලයක සිට අය නොවී පැවති අතර එම සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමක් පවතින බවට තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් නොතිබුණි. මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන තිබුණු නමුත්, ලැබිය යුතු මුදල 2019 දෙසැම්බර් 31 දක්වාත් ආපසු අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.. | නීතිපතිට අනුව නඩු පැවරිය හැකි කාලසීමාව ඉක්මවා ගොස් ඇති බව සඳහන් වන අතර මුදල් අයකර ගැනීම සඳහා ණයගැතියාට එරෙහිව ගතහැකි සිවිල් නීතිකෘත්‍යයද මණ්ඩලය සම්බන්ධයෙන් සාර්ථක නොවිය හැක. කෙසේ වෙතත් පොලිසියට කරන ලද ප්‍රකාශයක් මගින් හෝ එන්තර වාසියකට ලද ප්‍රතිචාරයක් මගින් ලැබියයුතු මුදල් සම්බන්ධයෙන් පිළිගැනීමක් ලබා ගත හැකිනම් කාලාවරෝධය මැඩපැවැත්වීම සහ නීතිමය ක්‍රියාමාර්ග සඳහා පෙළඹීමේ හැකියාවක් තිබිය හැක. ආයෝජන මණ්ඩලය වෙන්දේසිකරු සිටින ස්ථානය සොයා ගැනීමට බොහෝ වාර ගණනක් සහ විවිධ ක්‍රම ඔස්සේ උත්සාහ කළද, ඒ සියලු උත්සාහයන් අසාර්ථක විය. | නීතිපතිට අනුව කාලීන වශයෙන් කටයුතු කළ යුතුය. |
| (උ) | රජයේ ආයතන වලින් ලැබිය යුතු රු.37,680,103 ක් වසර 4 ට වැඩි කාලයක් අය නොවී පැවතුණි. එයින්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු රු 37,412,573 ක් වසර දොළහකට වැඩි කාලයක් මුළුල්ලේ නොවෙනස්ව පැවතුනි. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දක්වාත් මෙම ශේෂයන් අයකර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන්, වසර පහකට වැඩි කාලයක් මුළුල්ලේ රජයේ ආයතනවලින් අය විය යුතු ශේෂයන් සම්බන්ධයෙන් සියයට සියයක හානිකරණ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.. | ව්‍යාපෘතියක් සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ දේපල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත මුදාහල පසු ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් අයවියයුතු මුදල පියවාගත හැකිවනු ඇත. රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, මේ සම්බන්ධයෙන් සොයා බැලීමටත් ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සමඟ සාකච්ඡා කර සුදුසු තීරණයක් ගැනීමටත් එකඟ විය. හිඟ මුදල් පියවන ලෙස මණ්ඩලය විසින් සිහි කැඳවීම් කර ඇතත්, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් | හිඟහිටි ශේෂයන් ප්‍රමාදයකින් තොරව අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ධනාත්මක ප්‍රතිචාරයක් නොලැබුණි. | |
| (උ) | සීතාවක අපනයන සැකසුම් කලාපය විසින් ගෙවන ලද රු. 7,291,354 ක් සහ බියගම අපනයන සැකසුම් කලාපය විසින් ගෙවන ලද රු. 6,563,247 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පිළිවෙලින් වසර 2 සහ 4 ක කාලයක් මුළුල්ලේ පියවා නො තිබුණි. | සීතාවක අපනයන සැකසුම් කලාපයේ කොන්ත්‍රාත්තුව 2020 නොවැම්බර් මාසයේ දී ආරම්භ වීමට නියමිතය. බියගම අපනයන සැකසුම් කලාපයේ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම අවසන් කර අත්තිකාරම් බැඳුම්කර ඇපකරය අහිමි කරන ලදී. ඉදිකිරීම් ඇපකර අරමුදල ඉල්ලීම නොපිලිගත් අතර මේ වන විට මෙම කාරණය අධිකරණ ක්‍රියාවලියෙහි පවතී. වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වලින් කොටසක් අතුරු බිල්පත් මගින් අයකරගෙන ඇත. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ප්‍රමාදයකින් තොරව අය කර ගත යුතුය. |

**1.7.2 ගෙවිය යුතු මුදල්**

-----------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | ----------------------------- | ----------- |
| (අ) | එකතුව රු. 6,315,327 ක් වූ විවිධ ණයහිමියන් වර්ෂ 3 කට වැඩි කාලයක් මුළුල්ලේ නිරවුල් කර නොතිබුණි. | නිරීක්ෂණය සටහන් කරගෙන ඇති අතර 2020 මූල්‍ය වර්ෂයේදී සමාලෝචනය කර ගලපනු ලැබේ. කාල සීමාවේ අදාළතාවය හේතුවෙන්, ණයහිමියාට වසර 6 ක කාලයක් තුළ හිමිකම් පෑමක් කළ හැකිය. එබැවින්, යම් ගැලපීමක් කිරීමට පෙර ඉදිරියට ලැබීම් අවම වශයෙන් අවුරුදු 6 ක කාලයක් පවතිනු ඇත. | ගිවිසගත් කාල පරිච්ඡේදය තුල ණයහිමියන් පියවිය යුතුය. |
| (ආ) | එකතුව රු. 36,960,139 ක් වූ රඳවාගැනීම් මුදල් වලින් කොන්ත්‍රාත් 29 කට අදාළ රු. 4,766,262 ක මුදලක් වර්ෂ තුනකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. | අදාළ කලාප සහ දෙපාර්තමේන්තු වලින් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, නිදහස් කළ හැකි මුදල් නිදහස් කිරීමට පියවර ගන්නා අතර අනෙකුත් රඳවාගැනීම් මුදල් ආදායමක් ලෙස සළකා ගිණුම්ගත කරනු ලැබේ. | නිදහස්කල හැකි මුදල් නිදහස් කිරීමට පියවර ගතයුතු අතර අනෙකුත් මුදල් ආදායම් ලෙස සලකා කටයුතු කල යුතුය. |

එසේම හිමිකම් නොපෑම හේතුවෙන් රඳවා ගැනීමේ මුදල් සමුච්චිත වීම වළක්වා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් කාලය ඉකුත්වී මාස හයක් ඇතුළත රඳවාගැනීම් මුදල් සම්බන්ධයෙන් හිමිකම් පෑ යුතු බවට නව වගන්තියක් කොන්ත්‍රාත්ත්තුවේ කොන්දේසි අතරට ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත. එසේම, 2019 වර්ෂය තුළදී හිමිකම් නොපෑ කොන්ත්‍රාත්තු 03 කට අදාල රු. 698,770 / - ක් වූ රඳවා ගැනීමේ මුදල් ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට පියවර ගෙන ඇත.

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| **(අ)** | 1971 අංක 38 දරන මුදල් පනතේ 10 (5) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය විසර්ජනයන්ගෙන් පසුව ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. | ජාතික අයවැය යෝජනා යටතේ නව අපනයන සැකසුම් කලාප පිහිටුවීම සහ ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන පවත්නා කලාපවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වැනි සංවර්ධන මූලාරම්භයන් ආයෝජන මණ්ඩලය වෙත පැවරී ඇති අතර එවැනි මූලාරම්භයන් සඳහා මුළුමනින්ම අරමුදල් සපයනු ලබන්නේ ආයෝජන මණ්ඩලය විසිනි. කෙසේ වෙතත් මණ්ඩලය විසින් ඔවුන්ගේ ඉල්ලීම මත වාර්ෂිකව මහා භාණ්ඩාගාරයට ලාභාංශ ගෙවනු ලැබේ. | සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය විසර්ජනයන් ගෙන් පසුව ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අදාල අමාත්‍යවරයා විසින් ලබාදුන් අනුමැතිය රහිතව 2019 වර්ෂය තුළ රු.17,136,814,477 ක මුදලක් මණ්ඩලය විසින් ආයෝජනය කර තිබුණි. | අමාත්‍යාංශය විසින් ලබා දී ඇති අනුමැතියේ පිටපතක් 2016.07.06 දින රජයේ විගණන ශාඛාවට භාර දී ඇත | මුදල් අමාත්‍යවරයා ගේ එකඟත්වය ඇතිව අදාල අමාත්‍යවරයා ගේ අනුමැතිය ලබාගත යුතුය |
| (ඇ) | මුදල් රෙගුලාසි 104(3) සහ 104(4) | 2019 වර්ෂය තුල සිදුවූ වාහන අනතුරු 13ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා හෝ පූර්ණ වාර්තා 2019 දෙසැම්බර් 31 දින වන තුරුත් මණ්ඩලය විසින් ඉදිරිපත්කර නොතිබුණි. | වාහන අනතුරු ඉතා සුළු ප්‍රමාණයේ ඒවා වූ අතර ඒවා වෙනත් රියදුරන්ගේ දෝෂ හේතුවෙන් සිදුවී තිබුණි. හැකි සෑම අවස්ථාවකදීම මණ්ඩලය විසින් ආසන්නතම පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර ඇත. | සම්පූර්ණ පරීක්ෂණයක් සිදුකිරීමට දින 7කට වැඩි කාලයක් ගත වන්නේ නම් කඩිනමින් ප්‍රාරම්භක වාර්තාවක් යැවිය යුතු අතර විමර්ශනයෙන් පසු හානිය සිදුවූ දින සිට මාස 3ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත්කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 770 (2) | සමාලෝචිත වර්ෂය තුළදී රු.20,675,543 ක් වටිනා ස්ථාවර වත්කම් ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතියකින් තොරව අපහරණය කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට යටත්ව ශ්‍රීමත් බාරොන් ජයතිලක ගොඩනැගිල්ලේ ගොඩගැසී තිබුණු අතිරික්ත භාණ්ඩ අපහරණය කරන ලදී. වසර 10 ක කාලයක් සඳහා සම්පූර්ණ ගොඩනැගිල්ල බදු දීමට මණ්ඩලය තීරණය කර ඇති අතර, ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කිරීම සඳහා ගොඩනැගිල්ල පිරිසිදු කර භාර දෙන ලෙස ආයෝජකයා ආයෝජන මණ්ඩලය වෙත දැනුම් දෙන ලදී. එබැවින්, ප්‍රසම්පාදන ක ක්‍රියාවලිය අනුගමනය කරමින් භාවිතයට නොගත් / ඉවතලන සියලුම භාණ්ඩ අපහරණය කරන ලදී. | ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් බැහැර කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඉ)** | 2015 ජුලි 10 දිනැති 02/2015 අංක දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ ඡේද අංක 06 (ආ) | රු .14,250,000 ක පිරිවැයක් සහිත වාහන 09 ක් බැහැර කිරීම පිළිබඳ අවසන් තීරණය අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ මත රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිළධාරී වෙතින් ලබාගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ආයෝජන මණ්ඩලය විසින් ආර්ථිකමය නොවන වාහන අඛණ්ඩව අදියර වශයෙන් බැහැර කරනු ලැබේ. වාහන ඇණියේ පිරිවැය ඵලදායී කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව සාකච්ඡා කරන ලද අතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ප්‍රධාන ගණන් දීමේ නිළධාරීවරයාට ආයෝජන මණ්ඩලයේ වාහන බැහැර කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුම් දෙන ලදී. | වාහන බැහැර කිරීම පිළිබඳ අවසන් තීරණය අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ මත පදනම්ව රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙතින් ලබා ගත යුතුය. |
| **(ඊ)** | 2019 දෙසැම්බර් 09 දිනැති පී.ඊ.ඩී 3/2019 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මණ්ඩලය විසින් එහි සියලු සේවකයන් සඳහා රු.62,000 ක් හෝ එක් මසක මූලික වැටුප යන දෙකෙන් වැඩි වටිනාකම වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණු අතර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය රහිතව 2019 වර්ෂය සඳහා ප්‍රසාද ද දීමනා වශයෙන් රු. 80,741,628 ක් ගෙවා තිබුණි. | ආයෝජන මණ්ඩලයේ ස්ථිර සේවකයින් සඳහා රු.60,000 ක් හෝ මාස එකහමාරක වැටුප යන දෙකෙන් වැඩි වටිනාකමද අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් සඳහා රු.60,000 බැගින්ද 2019 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා වශයෙන් ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය දී තිබුණි. කෙසේ වෙතත්, කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2019 වර්ෂය සඳහා රු.62,000 ක් හෝ එක් මසක මූලික වැටුප යන දෙකෙන් වැඩි වටිනාකම වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් හෙවීමට යෝජනා කරන ලදී. එසේම මෙම අතුරු පියවර ගැනීම සඳහා කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා දැනටමත් අවසර ලබා දී ඇති බව ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2016 ඔක්තෝබර් 27 දිනැති පී.ඊ.ඩී 1/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 වන වගන්තිය | සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ නිලධාරීන් 23 දෙනෙකු වෙත රියදුරු දීමනා වශයෙන් රු.8,498,331 ක් ගෙවා තිබුණි. | 2003 වර්ෂයේදී, ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ රියදුරෙකු වෙනුවට කුලී රියදුරෙකු සඳහා රු .15,000 ක මාසික දීමනාවක් ගෙවීමට තීරණය කර තිබුණි. මෙම ගෙවීම වසර 15 ක් එකම වටිනාකමකින් පැවති බැවින් 2019 වර්ෂයේදී වටිනාකම වැඩි කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. | නිලධාරීන් වෙනුවෙන් රියදුරෙකු සැපයීම හෝ රියදුරු දීමනාවක් ගෙවීම නොකල යුතුය. |
| (ඌ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්ති | මණ්ඩලයේ සේවකයන් හත් දෙනෙකු නියමිත අනුමැතිය ලබගැනීමෙන් තොරව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අතර 2019 වර්ෂය සඳහා වැටුප් හා අතිකාල දීමනා ලෙස රු. 863,692 ක මුදලක් වියදම් කර තිබුණි. | මුදා හරින ලද සේවකයින් සඳහා වන වියදම් අදාළ අමාත්‍යාංශයෙන් අය කර ගැනීමට කටයුතු කරනු ඇත | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යාංශය වෙත හෝ වෙනත් කිසිදු ආයතනයක් වෙත සේවකයන් මුදා නොහැරිය යුතු අතර එම කාලය තුල මණ්ඩලය විසින් මුදා හරින ලද සේවකයන් වෙත කිසිදු පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු1,158,307,307 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 759,093,091ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු399,214,216 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු වියදම රු. 424,257,940 කින් වැඩිවීමට ප්‍රතිරූපීව අයභාරය සහ මූල්‍ය ආදායම පිළිවෙලින් රු. 756,477,284 කින් සහ රු. 66,994,872 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

## 3.1 හඳුනාගත් පාඩු

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කටුනායක සහ බියගම අපනයන සැකසුම් කලාප විසින් වර්ෂය තුල කලාපවල ඝන අපද්‍රව්‍ය බැහැරකිරීම වෙනුවෙන් රු.29,455,908 ක මුදලක් වියදම්කර ඇති අතර ඒ වෙනුවෙන් ව්‍යාපාර වලින් රු.22,020,647 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඝන අපද්‍රව්‍ය බැහැරකිරීම සම්බන්ධයෙන් කලාප විසින් 2019 වර්ෂය තුලදී රු.7,435,261 ක අලාභයක් ලබා තිබුණි. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පාඩුව ඒ සඳහා කලින් භාවිතා කළ ඉඩම බදු දීමෙන් උපයන ලද අතිරේක ආදායමෙන් ආවරණය කරගෙන ඇත. | ආයෝජන සඳහා ඉඩම් යොදාගැනීම ප්‍රශස්ත කර ගන්නා අතරම ඝන අපද්‍රව්‍ය බැහැරකිරීමේ අලාභය අවම කරගත යුතුය. |
| (ආ) මණ්ඩලයේ කළමනාකාරිත්වයේ පූර්ව අනුමැතියකින් තොරව රටින් පිටවීම හේතුවෙන් මණ්ඩලයේ හිටපු විධායක සහකාරවරයකුගේ සේවය මාසික වැටුප නොගෙවා 2013 ඔක්තෝබර් 24 දින අත්හිටුවා තිබුණි. මූලික පරීක්ෂණ පැවැත්වීමෙන් පසු සේවකයාට චෝදනා පත්‍රයක් නිකුත් කරන ලද අතර ගෘහස්ථ විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව සහ සේවය අත්හිටුවීමේ කාලයට අදාළ මාසික ඉපැයීම් නොගෙවා මණ්ඩලය විසින් 2016 දෙසැම්බර් 02 දින එම සේවකයාගේ සේවය අවසන් කර තිබුණි. සේවය අවසන් කළ සේවකයා වන්දි මුදලක් ඉල්ලා මණ්ඩලයට එරෙහිව කොළඹ කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් ගොනු කර තිබුණි. තීන්දුවට අනුව, සේවය අවසන් කිරීම අයුක්ති සහගත වූ අතර සේවය අවසන් කරන ලද | කම්කරු විනිශ්චය සභාවේ නියෝගයට අනුව විධායක සහකාර වරයාගේ සේවය අවසන් කිරීම අයුක්ති සහගත වන අතර සේවකයාට රුපියල්. 1,300,968 / - ක වන්දි මුදලක් ගෙවන ලෙස එය මණ්ඩලයට නියෝග කළේය.<br>ඒ අනුව, කාර්මික ආරවුලේ සම්පූර්ණ හා අවසාන විසඳුම ලෙස කොළඹ කම්කරු විනිශ්චය සභාවේ එම මුදල තැන්පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබේ. | සේවය අවසන් කිරීම යුක්ති සහගත ආකාරයෙන් කළ යුතුය. |

සේවකයාට 2019 වර්ෂය තුළදී රු. 1,300,968 ක වන්දි මුදලක් ගෙවීමට මණ්ඩලයට සිදු විය.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සීතාවක, කොග්ගල, කටුනායක සහ වතුපිටිවෙල අපනයන සැකසුම් කලාපයන්හි සහ මහනුවර කාර්මික උද්‍යානයෙහි පිහිටි වර්ග අඩි 69,354 ක විශාලත්වයකින් යුතු පරිශ්‍ර හැට පහක් රු. 26,080,283 ක වාර්ෂික කුලියක් යටතේ ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීමකින් තොරව භාහිර පාර්ශවයන් වෙත බදු දී තිබුණි. | ගිවිසුම් සකස්කර අවසන්කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | ප්‍රමාදයකින් තොරව ගිවිසුම් වලට එළඹිය යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂය සහ ඉකුත් වර්ෂ හතර සඳහා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ප්‍රගතිය පහත දැක්වේ. | | |

| වර්ෂය | ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (නව ගිවිසුම් සහ දීර්ඝ කිරීම්) | වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (නව ගිවිසුම් සහ දීර්ඝ කිරීම්) | අත්හිටුවන ලද ගිවිසුම් අවලංගු සංඛ්‍යාව | වසා දමන ලද හෝ අවලංගු කරන ලද ව්‍යාපෘති | |
|---|---|---|---|---|---|
| | | | අත්හිටුවන ලද | වසා දමන ලද | ගිවිසුම් අවලංගු කරන ලද |
| 2015 | 157 | 113 | 2 | 12 | 23 |
| 2016 | 186 | 106 | 3 | 6 | 79 |
| 2017 | 104 | 104 | 4 | 6 | 152 |
| 2018 | 95 | 91 | 10 | 23 | 156 |
| 2019 | 105 | 60 | 27 | 20 | 140 |

| | | | |
|---|---|---|---|
| | මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | වර්ෂ 2015 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුළ ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවෙහි කැපීපෙනෙන අඩුවීමක් නිරීක්ෂණය විය. | 2016 ජුනි සිට 2018 අප්‍රේල් දක්වා ආකර්ශනීය බදු දිරිගැන්වීමේ තන්ත්‍රයක් නොපැවතීම නිසා ආයෝජන ව්‍යාපෘති ආකර්ෂණය වීම අඩුවිය. 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනත යටතේ 2018 අප්‍රේල් මාසයේ දී නව ආයෝජන දිරිගැන්වීමේ තන්ත්‍රයක් හඳුන්වා දී තිබුණද, මෙම යෝජනා ක්‍රමය යටතේ ආකර්ෂණය වන ව්‍යාපෘති සඳහා වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා සැලකිය යුතු කාලයක් අවශ්‍ය වේ. ඊට අමතරව, මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර ආයෝජකයින්ට ඉඩම් නිෂ්කාශනය, පාරිසරික නිෂ්කාශනය, නාගරික සංවර්ධන අධිකාරිය, පළාත් පාලන යනාදී විවිධ අනුමැතීන් ලබා ගත යුතු බැවින් ආයෝජන මණ්ඩලයට පාලනය කළ නොහැකි විවිධ හේතු නිසා ව්‍යාපෘති එහි වාණිජ කටයුතු ආරම්භ කිරීමට ප්‍රමාද වේ. | ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගත යුතුය. ඊට අමතරව, ආයෝජකයින්ට වෙනත් බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීමට සහය වීම සඳහා මණ්ඩලය විසින් ක්‍රියා පටිපාටියක් හඳුන්වා දිය යුතුය. |
| (ii) | 2019 වර්ෂය තුළදී ගිවිසුම් අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවට වඩා වැඩි බව නිරූපනය විය. | නව ව්‍යාපෘති සඳහා භාවිතා කළ හැකි සංවර්ධිත ඉඩම් ක්‍රියාත්මක නොවූ සහ ආයෝජන උපලබ්ධි | ගිවිසුම් අවලංගු වීම අඩුකිරීමට සහ ව්‍යාපෘති ආරම්භකිරීම වර්ධනය කිරීමට |

| | |
|---|---|
| නොවී දීර්ඝ කාලයක් පැවති ව්‍යාපෘති විසින් අවහිර කර ඇති බැවින් මුදල් අමාත්‍යාංශයේ උපදෙස් අනුව සහ ක්‍රියාත්මක නොවූ සහ ආයෝජන උපලබ්ධි නොවී දීර්ඝ කාලයක් පැවති ව්‍යාපෘති හඳුනා ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණය අනුව එම ව්‍යාපෘතිවල ගිවිසුම් අවලංගු කරන ලදී. මෙම පියවර මුලින් ම 2013 වර්ෂයේදී දී ගනු ලැබූ අතර එය අඛණ්ඩව ක්‍රියාත්මක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2015 - 2019 කාලය තුල අවලංගු කරන ලද ව්‍යාපෘති ගණන ඉහළ අගයක් පෙන්නුම් කරයි. | මණ්ඩලය විසින් පියවර ගත යුතුය. |

**(ආ)** 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන (FDI) පහත දැක්වේ.

| **වර්ෂය** | **2014-2016 සහ 2017-2020 සංයුක්ත සැලැස්ම අනුව වාර්ෂික ඉලක්කය එ.ජ.ඩො. මිලියන** | **සත්‍ය ඉවුකර ගැනීම් එ.ජ.ඩො. මිලියන** | **සත්‍ය ඉවුකර ගැනීම් වාර්ෂික ඉලක්ක වල ප්‍රතිශතයක් ලෙස** |
|---|---:|---:|---:|
| 2015 | 3,500 | 970 | 28% |
| 2016 | 5000 | 801 | 16% |
| 2017 | 1,000 | 1,710 | 171% |
| 2018 | 2,500 | 2,367 | 95% |
| 2019 | 3,000 | 1,189 | 40 % |

| | | |
|---|---|---|
| 2019 වර්ෂය තුළ මණ්ඩලය විසින් සත්‍ය වශයෙන් ආකර්ෂණය කර ගත් සෘජු විදේශ ආයෝජන ඉලක්ක ගත අගයෙන් සියයට 40 ක් පමණක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 50 කින් අඩු වී තිබුණි. | ආයෝජන මණ්ඩලයේ පාලනයෙන් බැහැර වූ අනපේක්ෂිත බාහිර අහිතකර සාධකයන් | ඉලක්ක සපුරා ගත හැකි පරිදි විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා |

| | | |
|---|---|---|
| | හේතුවෙන් අපේක්ෂිත පරිදි සෑම විටම නියමිත ඉලක්කය සපුරා ගත නොහැක. මේ අනුව, 2018 ඔක්තෝබර් සිට 2019 දෙසැම්බර් දක්වා පැවති දේශපාලන අවිනිශ්චිතතාවය සහ 2019 අප්‍රේල් මාසයේ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය 2019 වර්ෂයේ ඍජු විදේශ ආයෝජන කාර්ය සාධනය කෙරෙහි බරපතල බලපෑමක් ඇති කරන ලදී. එසේම බදු තන්ත්‍රය සඳහා 2019 අප්‍රේල් මාසයේ අපේක්ෂිත දේශීය ආදායම් සංශෝධන මෙතෙක් නිකුත් කර නොමැති අතර පරිපාලනමය තීරණ පමණක් ලබා දී ඇත. | මණ්ඩලය උපාය මාර්ග සකස් කළ යුතුය. |
| **(ඇ)** සමාගමකට පවරා දෙන ලද බදු දේපල පිළිබඳ හිමිකම් හා අයිතීන් සහ එහි ගොඩනැගිලි හා එම පවරන ලද දේපළවල ස්ථිරව සවි කරන ලද සියලු පිරියත, යන්ත්‍රෝපකරණ සහ සවිකිරීම්, ත්‍රෛපාර්ශවීය ගිවිසුම් අත්සන් කිරීම මඟින් කිසියම් බැංකුවක හා/හෝ ණය ලබාදෙන ආයතනයක උකස් කිරීම සඳහා මණ්ඩලය විසින් ආයෝජන සමාගම් වලට අවසර ලබා දී තිබුණි කෙසේ වෙතත්, මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය පැහැර හැරීමෙන් ඇතැම් සමාගම් ඇවර කිරීම් මඟින් අවසන් වී තිබුණි. උකස් කරන ලද දේපළ වලට අදාලව නිරවුල් නොවූ ගැටළු හේතුවෙන් ඉඩම් වටිනාකම අහිමි වීම, සහ නිෂ්කාර්ය වන ඉඩම් වල ආවස්ථික පිරිවැය ආදිය පිළිබඳ අලාභ දැරීමට මණ්ඩලයට සිදුවී තිබුණි. ඇතැම් අවස්ථා පහත දැක්වේ. | | |
| (i) හොරණ මාපුටුගල පර්ත් වත්ත ආයුර්වේද වෛද්‍ය ආයතනයක් වෙත බදු දී තිබුණි. එකී දේපල රජයේ බැංකුවක් වෙත උකස් කර එමගින් රු.5,000,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. එසේම, එකී ණය මුදල ලබාගැනීමේදී ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට එළඹී බවට කිසිදු සාක්ෂියක් නොතිබුණි. ණය මුදල ගෙවීමට අපොහොසත් වීම මත 2013 මැයි 12 දින බැංකුව විසින් දේපල අත්පත් කර ගෙන තිබුණු | ඉඩමේ කල්බදු අයිතිය පැවරීම සඳහා බැංකුව අනාගත ගැනුම්කරුවන් සොයමින් සිටී. දැනට, අනාගත ආයෝජකයින්ගෙන් යෝජනා ඉල්ලීම | ඉඩම නිෂ්කාර්ය වීමේ ආවස්ථික පිරිවැය අවම කිරීම සඳහා ඉඩම අනාගත ආයෝජකයෙකුට බදු දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර එය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තීරණය කර තිබුණි. නව ආයෝජකයෙකු බදු දේපළ මිලදී ගැනීම සඳහා එකගතාවය පළකර තිබුණද, දේපළ බදුදීම සම්බන්ධයෙන් මණ්ඩලය සහ නව ආයෝජකයෙකු අතර 2019 දෙසැම්බර් 31 දින දක්වාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | සඳහා ඉඩම සම්බන්ධයෙන් ප්‍රචාරණය කිරීමට සූදානමින් පවතී. | |
| (ii) | මිරිගම අපනයන සැකසුම් කලාපයේ ඉඩමක් ඇඟලුම් සමාගමකට බදු දී තිබුණි. එම දේපල පෞද්ගලික බැංකුවකට උකස් කර ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට එළඹ තිබුණි. සමාගම 2011 වර්ෂයේ මෙහෙයුම් වසා දමා ඇති අතර සමාගම ණය පැහැර හැරීම නිසා 2011 ජූලි 12 වන දින පැවති පොදු වෙන්දේසියකදී දේපලෙහි කල්බදු අයිතිය බැංකුව විසින් අත්පත් කර ගෙන තිබුණු අතර 2019 පෙබරවාරි 28 වන විට හිඟ ණය මුදල ඇමරිකානු ඩොලර් 796,513ක් විය. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් දේපළ බදු දීම සඳහා මණ්ඩලය සහ නව ආයෝජකයෙකු අතර ගිවිසුමකට එළඹ නොතිබුණි. | ආයෝජන මණ්ඩල යේ කලාප වල ඇති හිස් ඉඩම් සම්බන්ධයෙන් ලංසු කැඳවීම සඳහා මෑතකදී ආයෝජන මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද මුද්‍රිත දැන්වීමකට මෙම ඉඩම ඇතුළත් කර ඇත. | ඉඩම නිෂ්කාර්ය වීමේ ආවස්ථික පිරිවැය අවම කිරීම සඳහා ඉඩම අනාගත ආයෝජකයෙකුට බදු දිය යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 මාර්තු 24 දින පැවති මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ ව්‍යාපාරයක් විවෘත කිරීමේ උත්සවය සඳහා මණ්ඩලය විසින් රු. 6,001,637 ක් වැය කර තිබුණි. මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක විවෘත කිරීමේ උත්සවයක් සඳහා මණ්ඩලයේ අරමුදල් වියදම් කිරීමේ පදනම විගණනයට අනාවරණය නොවීය. | මෙවැනි වියදම් සඳහා මණ්ඩලය සහාය දැක්වීමට පදනම වූයේ ආයෝජනයේ සැලකිය යුතු ප්‍රමාණයේ වටිනාකම ස සහ ව්‍යාපෘති වලින් ආර්ථිකයට වන බලපෑමය. මෙම අවස්ථාවට අදාළ වියදම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. උත්සවය අග්‍රාමාත්‍යතුමාගේ සහ සම්භාවනීය ආරාධිතයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර එබැවින් එය ජාතික උත්සවයක් විය. | මණ්ඩලය යටතේ ලියාපදිංචි කර ඇති ව්‍යාපාරයන්හි විවෘත කිරීමේ උත්සව වියදම් මණ්ඩලය විසින් නොදැරිය යුතුය. |

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සීතාවක අපනයන සැකසුම් කලාපයේ රු. 10,007,186 ක් පිරිවැය වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 82 ක් වසර පහකට වැඩි කාලයක් මුළුල්ලේ භාවිතයට ගෙන නොතිබුණි. | එම භාණ්ඩ වසර 5 කට වැඩි කාලයක් මුළුල්ලේ භාවිතා කර නොමැති අතර කළමනාකරණයේ අනුමැතිය ඇතිව එම භාණ්ඩ වෙන්දේසි කිරීමට පියවර ගනු ලැබේ. | අත්‍යාවශ්‍ය භාණ්ඩ පමණක් මිලදී ගත යුතු අතර වත්කම් නිෂ්ක්‍රීයව තබා නොගෙන භාවිතයට ගත යුතුය. |

## 3.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2004 සිට 2015 දක්වා කාලය තුළ අපනයන සැකසුම් කලාප 05 ක් සහ ප්‍රධාන කාර්යාලය විසින් ආරම්භ කළ ව්‍යාපෘති 14 ක් නිම කිරීමට මණ්ඩලය පියවර ගෙන නොතිබුණු අතර ඒ සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට රු.605,950,756 ක් වැය කර තිබුණි. | ඇතැම් ව්‍යාපෘති නිම කර නොමැති අතර ඇතැම් ව්‍යාපෘති වල ගිවිසුම් අවසන් කර ඇතත් ගැටළු නිරාකරණය කළ යුතුව ඇත. 2020 වර්ෂයේදී කඩිනමින් ව්‍යාපෘතිවල කටයුතු අවසන් කිරීමට පියවර ගනු ලැබේ. . | අඛණ්ඩව පසු විපරම් කළ යුතු අතර නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘති නිම කළ යුතුය. |
| (ආ) ජලයේ ගුණාත්මකභාවය සහ කලාපයේ ආයෝජකයින්ට අඛණ්ඩ ජල සැපයුම සහතික කිරීමේ අරමුණින් සීතාවක අපනයන සැකසුම් කලාපයේ ජල පවිත්‍රාගාරයේ අධිවේගී වැලි පෙරහන් වල මාධ්‍ය පෙරහන් (06 ක්) ප්‍රතිස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව රු .16, 040,980 ක මුදලකට 2017 ජුනි 27 දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ප්‍රදානය කර තිබුණි. රු. 7,291,354 ක් අත්තිකාරම් වශයෙන් 2017 ජූලි 31 දින ගෙවා ඇති අතර, කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 23 වන දින වන විට නිම කළ යුතු විය. කෙසේ වෙතත්, 2020 පෙබරවාරි 13 වන විටත් මෙම කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර නොතිබුණි. | ඇන්ත්‍රසයිට් සැපයීම හා බෙදා හැරීම සහ පෙරහන් පුනරුත්ථාපනය කිරීම සඳහා වෙනම ටෙන්ඩර් දෙකක් ඇති බව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වාචිකව දැනුම් දී ඇත. මෙම ටෙන්ඩර් දෙකම අවසන් කර ඇති අතර මේ වනවිට එම ටෙන්ඩර් ප්‍රදානය කිරීමේ අදියරේ පවතී. | ව්‍යාපෘති නියමිත කාල සීමාව තුළ නිම කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත කාර්ය මණ්ඩලයේ සීමාවන් සැලකිල්ලට ගැනීමකින් තොරව පෙර වර්ෂ වලදී ස්ථිර, කොන්ත්‍රාත් සහ අනියම් පදනමින් සේවකයන් ගණනාවක් බඳවා ගැනීම හේතුවෙන් එක් | සේවයේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව විධායක අධ්‍යක්ෂ තනතුරු තුනක් සඳහා පත්වීම් ලබා දෙන ලදී. එබැවින් විධායක | සේවකයන් බඳවාගැනීමේදී මණ්ඩලයේ මානව සම්පත් අවශ්‍යතාවය සැලකිල්ලට ගතයුතුය. |

| | | |
|---|---|---|
| විධායක අධ්‍යක්ෂවරයෙක්, කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) 20 ක් සහ ප්‍රාථමික මට්ටමේ (නුපුහුණු) සේවකයන් 111 ක් අනුමත කාර්ය මණ්ඩලයට වඩා අතිරික්තව පැවතුණි. | අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ඇත. මීට අමතරව, කළමනාකරණ සහකාර කාණ්ඩයේ සහ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු කාණ්ඩයේ අතිරික්ත සේවකයින් අනියම් / කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් සේවකයින් වන අතර ඔවුන් 2019 සැප්තැම්බර් 18 දිනැති 29/2019 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කර ඇත. | |
| **(ආ)** මණ්ඩලයේ කළමනාකරණ මට්ටමේ සේවකයින් 529 න් සේවකයින් 120 ක් වයස අවුරුදු 60 සම්පූර්ණ කර ඉදිරි වසර පහ තුළ විශ්‍රාම ගැනීමට නියමිතය. කෙසේ වෙතත්, අනාගත මානව සම්පත් අවශ්‍යතා සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය විසින් සකස් කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස වන්නේ අනුප්‍රාප්තික සැලැස්ම සකස් කළ යුත්තේ එම අංශයෙහි පළපුරුද්ද සහ විශේෂ වූ ප්‍රවීණතාවයක් සහිත වෘත්තීය ආයතනයක් හෝ පුද්ගලයෙකු විසිනි. ඒ අනුව අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. | අනාගත මානව සම්පත් අවශ්‍යතා සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් ප්‍රමාදයකින් තොරව සකස් කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2019 වර්ෂය තුළ නිමකිරීමට සැළසුම් කරන ලද රු. මිලියන 6,764.8 ක ප්‍රතිපාදන සහිත ක්‍රියාකාරකම් එකසිය එකක් සැළසුම් කළ පරිදි නිම කර නොතිබුණි. | ඇතැම් ක්‍රියාකාරකම් නියමිත දිනට නිමකර ඇති අතර විවිධ හේතූන් මත අනෙකුත් ක්‍රියාකාරකම් සිදුකෙරෙමින් පවතී. | වර්ෂය තුළ නිමකිරීමට සැළසුම් කරන ලද ක්‍රියාකාරකම් සැළසුම් කළ පරිදි නිම කළ යුතුය. |

**4.2** **පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** මෙහෙයුම් කටයුතු සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) ලබා ගත යුතු සීතාවක, හොරණ සහ කොග්ගල අපනයන සැකසුම් කලාප මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුගත නොවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට අවුරුදු 02 සිට අවුරුදු 08 දක්වා කාලයක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමෙන් තොරව ක්‍රියාත්මක වී තිබුණි | කොග්ගල අපනයන සැකසුම් කලාපයේ පරිසර ආරක්ෂණ බලපත්‍රය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරීක්ෂණයක් සිදු කරන ලද අතර මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රතිචාරය බලාපොරොත්තුවෙන් සිටිමු. සීතාවක සහ හොරණ අපනයන සැකසුම් කලාපවල පොදු අපජල පවිත්‍රාගාර, වැඩි දියුණු කිරීම අවශ්‍ය වන අතර දැනට ඒ සඳහා යොමු වී ඇත. කෙසේ වෙතත්, මේ සඳහා වසර 02 ක කාලයක් ගතවනු ඇති අතර එය පරිසර ආරක්ෂණ බලපත්‍රය සඳහා සපුරාලිය යුතු එකම නිර්ණායකය වේ. | අපනයන සැකසුම් කලාප සඳහා ප්‍රමාදයකින් තොරව පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට මණ්ඩලය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ආ)** පරිසර හිතකාමී ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමට ඵලදායී යාන්ත්‍රණයක් නොමැති වීම හේතුවෙන් හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි ව්‍යාපාරයක නිෂ්පාදන ක්‍රියාවලිය මඟින් ජනනය කරන අන්තරායකර අපද්‍රව්‍ය වසර හතරක කාලයක් මුළුල්ලේ කර්මාන්තශාලා පරිශ්‍රය තුළ එක් රැස් වී තිබුණි. | ශ්‍රී ලංකාවේ ඇති මෙම වර්ගයේ අන්තරායකර අපද්‍රව්‍ය සඳහා අනුමත බැහැර කිරීමේ ක්‍රමය සම සැකසුම් ක්‍රමයයි. වර්තමානයේදී, එවැනි අන්තරායකර අපද්‍රව්‍ය සම සැකසුම් සිදු කරනු ලබන ශ්‍රී ලංකාවේ එකම සමාගම අපද්‍රව්‍ය වල නුකුලතාවය තක්සේරු කරමින් සිටියි. එතෙක් මෙම අන්තරායකර අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස පරිශ්‍රය තුළ ගබඩා කර ඇත. | පරිසර හිතකාමී ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් ප්‍රමාදයකින් තොරව හඳුන්වා දිය යුතුය. |